ශ්‍රී ලංකා නිදහස් පක්ෂය
ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சி
SRI LANKA FREEDOM PARTY

සභාපති : මෛත්‍රීපාල සිරිසේන
தலைவர் : மைத்திரிபால சிறிசேன
President : Maithripala Sirisena

ප්‍රධාන ලේකම් : දයාසිරි ජයසේකර
பொதுச் செயலாளர் : தயாசிறி ஜயசேகர (சட்டத்தரணி)
Secretary : Dayasiri Jayasekara (Attorney at Law)

භාණ්ඩාගාරික : ධම්මික දසනායක
பொருளாளர் : துஷ்மந்த மித்ரபால சட்டத்தரணி
Treasurer : Dushmantha Mitrapala (Attorney at law)


2023.05.09

ශ්‍රී ලංකා ජනරජයේ 6 වන විධායක ජනාධිපති
ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති
ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා
ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මුලස්ථානය
අංක 301, ටී.බී. ජයා මාවත,
කොළඹ 10.

ගරු සභාපතිතුමනි,

**ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විනාශ කරන වර්තමාන ලේකම්වරයාගේ ක්‍රියාකලාපය හෙළා දකිමු**

මම පක්ෂයේ ජාතික සංවිධායකවරයා වශයෙන් ඉහත ලිපි ශීර්ෂය යටතේ ඔබතුමා සහ පක්ෂ සංවිධායකවරුන් වෙත පක්ෂයට ඉතා වැදගත්යැයි හැඟෙන එමෙන්ම, පක්ෂයේ උන්නතිය සහ අභිවෘද්ධිය මෙන්ම පක්ෂ සංවිධායකවරුන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය සහ දේශපාලනය කිරීමේ නිදහස පිළිබඳව සාකච්ඡා කරන ප්‍රධාන දේශපාලන කරුණු ගණනාවක් පක්ෂය වෙත ඉදිරිපත් කිරීමට මෙම ලිපිය තුළින් බලාපොරොත්තු වෙමි. එලෙසම ඔබතුමාගෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනු ලබන්නේ මෙම ලේඛනය පක්ෂයේ දේශපාලන මණ්ඩලය සහ මධ්‍යම කාරක සභාව වෙත යොමු කරන ලෙසත්, මෙහි සඳහන් පක්ෂයට ඉතා වැදගත් දේශපාලන කරුණු ප්‍රමුඛව පුළුල් දේශපාලන කථිකාවක් ආරම්භ කර පක්ෂයේ ඉදිරි ගමන පිළිබඳව "දැක්මක්" සකස් කර ගැනීම ඉතා වැදගත් බවයි. එමෙන්ම මා මෙම ලිපිය ලිවීමට අදහස් කරනු ලැබුවේ පක්ෂයේ සංවිධායකවරු සහ පාක්ෂික බොහෝ පිරිසකගේ ඉල්ලීම අනුව බවද සඳහන් කරමි.

ගරු සභාපතිතුමනි, ඔබතුමා ප්‍රජාතන්ත්‍රවාදයට සහ මානව නිදහසට ගරු කරන නායකයෙකු බවට සමාජ කථිකාවක් නිර්මාණය වීමට හේතු වූයේ මෙ රටේ හයවන විධායක ජනාධිපතිවරයා ලෙස එම ධූරය දරන කාල සීමාව තුළ ඔබතුමා වෙත එල්ල වුන නින්දා-අපහාස මෙන්ම දේශපාලන මඩ ප්‍රචාර සහ විවිධ අභූත චෝදනා සියල්ලම උපේක්ෂාවෙන් යුතුව බැහැර කිරීම සඳහා ඔබතුමා තුළ පැවති නිහතමානී හා මානවහිතවාදී ගති පැවතුම්වල ඇති ගුණයහපත් බව නිසාය.




301, ටී.බී. ජයා මාවත, කොළඹ 10. 301, டீ.பீ. ஜயா மாவத்தை, கொழும்பு 10. 301, T.B. Jayah Mawatha, Colombo 10.
දුරකථන : தொலைபேசி Tel: +94 011 2680125, +94 011 2680126, +94 011 2680127, +94 011 2680128, +94 011 3138115
ෆැක්ස් : பெக்ஸ் : Fax +94 011 2680187 විද්‍යුත් තැපෑල : E-mail: slfphqrv@gmail.com

2014.11.21 දින ඔබතුමා ගන්නා ලද ඓතිහාසික දේශපාලන තීරණය විසින්, ඒකාධිපතිවාදය, පවුල්වාදය සහ දූෂිතබව හේතුවෙන් විනාශය කරා ගමන් කරන ලද ශ්‍රී.ල.නි.ප.ය නිවැරදි මාවතට ගැනීමට හැකිවිය. ඒ අනුව ප්‍රජාතන්ත්‍රවාදය, සහෝදරත්වය, නිදහසින් පරිපූර්ණ සහ දූෂිත බවින් තොර පක්ෂයක් බවට පත් කිරීමට ඔබතුමාගේ නායකත්වයෙන් අපට හැකි විය. එලෙසම 2014.11.21 ඔබතුමා සමග එම ඓතිහාසික දේශපාලන පෙරළියට දායකවීමට මා හට අවස්ථාවක් ලැබීම භාග්‍යයක් සේ සළකමි.

**මෙම ඉහත ඡේදයේ සඳහන් කරුණු ඔබතුමා වෙත නැවත සිහිපත් කරනු ලැබුවේ එදා අවලාද, අවමාන, තර්ජන, ගර්ජන මැද ආරක්ෂා කරගනු ලැබූ අපගේ ආදරණීය පක්ෂය වර්තමානය වන විට අභ්‍යන්තර ගැටලු රැසකට මුහුණ දෙමින් සිටින බව ඔබතුමා වෙත අවධාරණය කිරීමටත් එමෙන්ම පක්ෂය භේද භින්න කරමින්, කැබලිවලට කඩා දමමින් සංවිධායකවරුන් අතර ප්‍රතිවිරෝධ මතුවන ආකාරයට කටයුතු කරමින් විවිධ කල්ලි කණ්ඩායම් ගොඩනැගීමේ ප්‍රවණතාවයක් මතුව ඇත. මෙහි අවසන් ඵලය වන්නේ පක්ෂය දුර්වල කිරීමය. එලෙස කටයුතු කරන ඉතා සූක්ෂම වැඩපිළිවෙලක් මේ වන විට යම් කණ්ඩායමක් විසින් මෙහෙයවමින් ක්‍රියාවට නංවමින් පවතී. ඔවුන්ගේ උපාය වන්නේ පක්ෂය නිරන්තරයෙන් දුර්වලතාවයට පත්වන බව රටට පෙන්වීමත්, එකී සියලුම සිදුවීම්වල අපවාද සහ අවලාද පක්ෂ නායකයා වශයෙන් ඔබතුමා වෙත පැවරීමට කටයුතු කිරීමත් ය. එයින් ඔබතුමාගේ කීර්තිනාමය ක්‍රමානුකූලව පක්ෂය තුළ පිරිහීමට ලක්කිරීම ඔවුන්ගේ පැහැදිලි ඉලක්කය වන බව නිසැකව තේරුම්ගත හැකිය.**

ගරු සභාපතිතුමනි, ඔබතුමා ජනාධිපතිධූරය දරන වකවානුව තුළ ශ්‍රී.ල.නි.ප.ය පාර්ලිමේන්තු මන්ත්‍රී කණ්ඩායම බෙදෙන්නට ඉඩ දුන්නේ නැත. ඉතා සංකීර්ණ පාර්ලිමේන්තු ඡන්ද විමසීම් අවස්ථාවලදී ඔබතුමා නිතර යෝජනා කරන ලද්දේ පක්ෂයේ මන්ත්‍රී කණ්ඩායම බෙදෙන්නේ නැතුව සාමූහික තීරණයකට පැමිණෙන ලෙසයි. එවකට 19 වෙනි ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවට ගෙන එන අවස්ථාවේ විපක්ෂයේ වාඩිවී සිටි ශ්‍රීලනිප මන්ත්‍රී කණ්ඩායම සහ මහින්ද රාජපක්ෂ මහතා සමග ද සාකච්ඡා කොට පාර්ලිමේන්තුව තුළ එය තුනෙන් දෙකේ ඡන්දයෙන් සම්මත කර ගැනීමට තරම් ඔබතුමා දක්ෂ විය. මෙම කරුණු සිහිපත් කරනු ලැබූයේ ඔබතුමා එවකට ශ්‍රීලනිප නායකයා සහ රටේ ජනාධිපතිවරයා වශයෙනුත් පක්ෂය තුළ සැමදෙනාගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය ආරක්ෂා කරගැනීමට කැපවුනු ආකාරය සිහිපත් කිරීමටය. එහි ඉතා වැදගත් ප්‍රතිඵලය වූයේ පක්ෂය නොබෙදී සහ නොකැඩී ආරක්ෂා වීමය.

ගරු සභාපතිතුමනි, මම ඔබතුමාගේ මෙවර මැයි දින කතාවේ ඉතා වැදගත් කොටසක් වෙත අවධානය යොමු කරමි. එනම් **"අපි මෙයින් ඉදිරියට කාගේවත් නායකත්වය යටතේ සන්ධාන හදන්නේ නෑ, මෙම මැතිවරණය කල්ගිය හේතුවෙන් අපිව දෙවියෝ බේරුවා". ඔබතුමාගේ මෙම ප්‍රකාශය ඉතා නිවැරදිය. එහෙත් මා විසින් ඔබතුමා වෙත සිහිපත් කරනු ලබන්නේ ඔබතුමා පක්ෂය මේ සන්ධාන ගැටයෙන්** ගලවා ගැනීමට 2023.01.15 දින **රාත්‍රියේ පක්ෂයේ දේශපාලන මණ්ඩලය රැස්කොට සන්ධානයක් සමග පක්ෂය ඉදිරියට යාමට ඇති බාධා සහ ගැටලු මේ වන විට ඔප්පු වී ඇති බව පවසා කරුණු පැහැදිලි කරමින්**

ඉතා නිවැරදිව ශ්‍රී.ල.නි.ප.යේ 2023 පළාත් පාලන මැතිවරණයට අත ලකුණින් තරග කළ යුතු බව තිරණය කරන ලදී. එම අදහස දේශපාලන මණ්ඩලය ඒකමතිකව අනුමත කලේය. නමුත් 2023.01.16 දින පක්ෂයේ ලේකම්වරයා එම දේශපාලන මණ්ඩල තිරණය ඔහුට අවශ්‍ය පරිදි විකෘති කරමින් ඔහුගේ අතිශය පෞද්ගලික අරමුණු වලට ගැළපෙන පරිදි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මෙම මැතිවරණයට ඉදිරිපත් වන්නේ සන්ධානය තුළින් බව විද්‍යුත් මාධ්‍ය ඔස්සේ ප්‍රකාශ කරන ලදී. මෙම ප්‍රකාශය සහ ලේකම්වරයාගේ ක්‍රියා කලාපය මැතිවරණයට අදාලව කල්පනා කළහොත් ඔහු හිතාමතා සහ සැළසුම් සහගතව පක්ෂය වළකට ඇද දැමීමට කටයුතු කළ ස්වභාවයක් පෙනී යනු ඇත. එලෙසම මෙම සන්ධාන සාකච්ඡා සහ සන්ධානය ගොඩනැගීම සම්බන්ධ කටයුතු වලදී පුරෝගාමීව කටයුතු කරනු ලැබුවේ පක්ෂයේ ලේකම්වරයායි. එහෙත් මෙකී සන්ධානය තුළ පක්ෂයට කිසිදු වැදගත් තනතුරක් හිමිවූයේ නැත. නමුත් නාමිකව සන්ධානයේ ලේකම් යන තනතුර පක්ෂයට ලබා දී පක්ෂය රැවටීමට ලක් කලේය. මෙම තනතුර සම්බන්ධව පක්ෂයේ ලේකම් දයාසිරි ජයසේකර ඔබතුමාට සහ පක්ෂයට ඉතා විශ්වාසයෙන් ප්‍රකාශ කලේ සන්ධාන ලේකම් ධුරයේ පූර්ණ බලතල ශ්‍රී.ල.නි.ප.යට ලැබෙන බවත්, ඔහු මෙකී කරුණු මැතිවරණ කොමිසමෙන් විමසා තහවුරු කරගත් බවත්ය. මෙය මැතිවරණ ව්‍යාපාරයේ නාම යෝජනා අවස්ථාවල ඉතා පැහැදිලිව ඔප්පු විය. එපමණක් නොව පොපර් එකේ ලේකම් නාම යෝජනා වලට අත්සන් කරමින් ලේකම්ධුරය අයිති ඔවුන්ගේ පක්ෂයට බවත්, ඔවුන් කටයුතු කරන්නේ ඔවුන්ට අවශ්‍ය විදිහට බව ද ප්‍රකාශ කර සිටියේය. ශ්‍රී.ල.නි.ප.යේ ඉතා ජ්‍යෙෂ්ඨ දිස්ත්‍රික් නායකයින් පවා ඔවුන් හැල්ලුවට ලක් කරමින් කටයුතු කලේය. (උදාහරණයක් ලෙස ඔවුන්ගේ බලපෑම හේතුවෙන් ඇති වූ පීඩාකාරී තත්ත්වය හමුවේ පක්ෂයේ ජ්‍යෙෂ්ඨයෙක් වූ කලුතර දිස්ත්‍රික් නායක රෙජිනෝල්ඩ් කුරේ මහතාගේ ජීවිතය අහිමිවීමට පවා හේතු කාරණා විය). මෙහිදී ඉතා පැහැදිලිව පක්ෂයේ ලේකම්වරයා වෙනත් අරමුණක් වෙනුවෙන් පක්ෂ නායකත්වය, පක්ෂයේ දේශපාලන මණ්ඩලය, මධ්‍යම කාරක සභාව සහ මුළු මහත් පක්ෂයම නොමග යවමින් කටයුතු කල බව ඉතා පැහැදිලිව තේරුම් ගැනීමට හැකි බව මාගේ විශ්වාසයයි.

එලෙසම 2023.01.16 වන දින පක්ෂයේ මාධ්‍ය ප්‍රකාශකවරයා වන වීරකුමාර දිසානායක මහතා අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී විද්‍යුත් මාධ්‍ය අමතා ශ්‍රී.ල.නි.ප යේ දේශපාලන මණ්ඩලය 2023 පළාත් පාලන මැතිවරණයට මුළු රටම අත ලකුණින් තරග කිරීමට තීරණය කල බව ප්‍රකාශ කලේය. පක්ෂයේ ලේකම්වරයා මාධ්‍ය අමතමින් පක්ෂය සන්ධානයකින් තරඟ කරන බව ප්‍රකාශ කලේද එදිනමය. ඒ අනුව ලේකම්වරයාගේ ප්‍රකාශයත්, මාධ්‍ය ප්‍රකාශකගේ ප්‍රකාශයත් එකිනෙට පරස්පර විය. එහෙත් එම ප්‍රකාශ දෙකෙහිම සත්‍ය අසත්‍ය බව පැහැදිලිව මෙන්ම ප්‍රායෝගිකව ඔප්පුවනු ලැබුවේ 2023.01.21 වන දින මුළු රටේම නාම යෝජනා ලබා දී අවසන් වූ පසුවයි. එනම් ඒ වන විට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ලේකම්වරයාගේ කෙනෙහිළිකම් මැද නමුත් ඔබතුමාගේ මැදිහත්වීම මත පළාත් පාලන ආයතන 260කට වැඩි ප්‍රමාණයකට අත ලකුණින් තරඟ කිරීමට නාම යෝජනා භාර දීමට සමත් වූ නිසාය.

ගරු සභාපතිතුමනි, මෙහි ඉතා හාස්‍යජනක විකෘති ස්වභාවය මුලු රටටම නිරූපණය වන්නේ ශ්‍රීලනිපයේ ලේකම්වරයා අත ලකුණ අත හැර වෙනත් ලකුණක් ජනප්‍රිය කිරීමට

චොපර් එකෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන සියල්ලන්ටම නාම යෝජනා භාර දීමත් පක්ෂයේ සභාපතිවරයා ලෙස ඔබතුමා අත ලකුණින් තරඟ කිරීමට පොලොන්නරුව දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන සියල්ලටම නාම යෝජනා ලබා දීමත් අනුවය. මෙයින් දයාසිරි ජයසේකර ශ්‍රීලනිපය ගොඩගැනීම වෙනුවෙන් කෙතරම් ප්‍රඥාගෝචර තීන්දු ගනු ලැබූ අයෙක් ද යන්න මුළු මහත් රට ඉදිරියේම නිරුවත් වී අවසන්ය. පක්ෂයේ ලේකම්වරයා අනුරාධපුර දිස්ත්‍රික්කයේ අත ලකුණින් තරග කරන පක්ෂයේ පළාත් පාලන අපේක්ෂක කණ්ඩායම දැනුවත් කිරීමට පැමිණීම සඳහා අපේක්ෂක හමුවට දින ලබා දී තිබිණි. නමුත් ඔහුට එම අපේක්ෂක හමුව පැවැත්වීමට නොහැකි විය. එයට හේතු වූයේ ඉහත මා ඉදිරිපත් කරන ලද දේශපාලන කරුනු හා සාධක අනුව මාගේ දිස්ත්‍රික්කයේ ආසන සංවිධායකවරුන් මෙන්ම පළාත් පාලන අපේක්ෂකවරුන් ද ඔහු එන රැස්වීමට පැමිණීම අනුමත නොකරන හෙයින්ය. ඔහුගේ එම පැමිනීම මා ද අනුමත නොකරන ලදී. එයට හේතු වූයේ කුරුණෑගල දිස්ත්‍රික්කය පවතින්නේ අනුරාධපුර දිස්ත්‍රික්කයට මායිම්වය. එය ප්‍රායෝගික කරුණකි. නමුත් ප්‍රධාන කරුණ වන්නේ දයාසිරි ජයසේකර චොපර් එක දිනවන්න කුරුණෑගල දිස්ත්‍රික්කයේ හා රට පුරා කතා කරනු ලබන අතරම අත ලකුණේ ජයග්‍රහණය වෙනුවෙන් පෙනී සිටින ආකාරය හා පෙනී සිටින මතවාදය කුමක් ද යන්නයි. අපි ඡන්ද දිනා ගත යුත්තේ පොදු මහජනයාගෙනි. අපව ජයග්‍රහණය කරා ගෙන යන්නේ එම බුද්ධිමත් ජන කණ්ඩායමය. වර්තමානය වන විට සමාජ මාධ්‍ය ඔස්සේ මෙන්ම විද්‍යුත් මාධ්‍ය ඔස්සේ රටේ ජනතාව විශාල දැනුමකින් සහ අවබෝධයකින් කටයුතු කරන බව පෙනී යන සාධකයක් වන්නේ රට පුරා පැන නැඟි අරගල සහ එයට සහභාගී වූ පුළුල් පොදු මහජනතාව අනුවය. එම නිසාම අප දේශපාලන නායකයන් වූ පමණින් අපට හිතෙන පරිදි විකාර හෝ පිස්සු නටන්නට පුලුවන්කමක් නොමැත. එනම් දයාසිරි ජයසේකර පක්ෂයේ ලේකම්වරයා වශයෙන් අත ලකුණට ඡන්දය ලබා දෙන්නට කියන අතරම චොපර් ලකුණටත් ඡන්දය ලබා දෙන්නට යැයි පවසන්නේ කෙසේද? මෙය එකම වේලාවේ විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යයේ විකාශය වන තත්ත්වයක් මැතිවරණ ව්‍යාපාරය ඉදිරියට ඇදුනේ නම් නිර්මාණය වීම නොවැළැක්විය හැකි සාධකයක් වනු ඇත. මෙයින් චොපර් එකට කිසිදු හානියක් වන්නේ නැත. නමුත් දයාසිරි ජයසේකර ශ්‍රී.ල.නි.ප ලේකම්වරයා වන හෙයින් එම මැතිවරණයේ සම්පූර්ණම ඡන්ද කැඩී යාම, ඡන්ද විනාස වී යාම, ඡන්ද එකතු කිරීමේ අපහසුතාවය මතු වන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපේක්ෂකයන්ටය. ඉතින් මේ පිළිබඳව කතා කරන , අදහස් ඉදිරිපත් කරන දුමින්ද දිසානායක වැරදිද?

ගරු සභාපතිතුමනි, මෙම පළාත් පාලන මැතිවරණය පක්ෂයේ ලේකම්වරයාගේ අත්තනෝමතික ක්‍රියාකලාපය හේතුවෙන් පක්ෂ අභ්‍යන්තරයේ ගැටුම්කාරී සහ කැරලිකාර ස්වභාවයක් ගනු ලැබුවේය. මෙහිදී ඔබතුමා දන්නා ප්‍රසිද්ධ කරුණක් වන්නේ කොළඹ දිස්ත්‍රික් බලයලත් නිලධාරී සහ මහරගම ආසන සංවිධායක සමන් පුෂ්පකුමාර මහතා පක්ෂ ලේකම්වරයාගේ මතවාදයට පිටින් ගොස් අත ලකුණින් කොළඹ දිස්ත්‍රික්කයේ නාම යෝජනා ලබා දීම හේතුවෙන් ඔහුට අභූත චෝදනා ගොනු කරමින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පැමිණිලි ගොනුකර බිය වද්දමින් ශ්‍රී.ල.නි.ප.යේ ජයග්‍රහණය වෙනුවෙන් කොළඹ දිස්ත්‍රික්කය තුළ ශ්‍රී.ල.නි.ප.යේ නැගිටීම යටකර පාගා දමා අකර්මණ්‍ය වන ආකාරයට කටයුතු කිරීම ලේකම්වරයා ශ්‍රී.ල.නි.ප.යට මෙම මැතිවරණයේදී ද්‍රෝහි

වීමකි. එහිදී ශ්‍රී.ල.නි.ප.යට ලැබෙන ඡන්ද සහ ඡන්ද ශක්තිය සහ කොළඹ දිස්ත්‍රික්කය තුළ දුර්වල කිරීමට කටයුතු කිරීමකි. ඔහු මෙවැනි ක්‍රියා සිදු කරනුයේ උපායශීලීත්වයෙන් පක්ෂය තුළ අලුතින් බිහිවන නව සංවිධායකවරු අණසකට ගැනීමේ අරමුණ ඇතිවය. මෙලෙස කටයුතු කිරීමෙන් අපට දැන උගත්, බුද්ධිමත් නව පරපුරක් සමග පක්ෂය ගොඩනගමින් ඉදිරියට යා හැකිදැයි බරපතල ප්‍රශ්නයක් ගොඩනැගීම නොවැළැක්විය හැකි කරුණක් වනු ඇත.

**ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ඉතිහාසයේ කිසිම දිනෙක පක්ෂ ලේකම්වරයෙකු මෙලෙස කටයුතු කර නැත. මා දන්නා පරිදි අපේ පක්ෂයේ දීර්ඝ කාලයක් ලේකම් ධූරය දරන ලද ලේකම්වරයා ඔබතුමාය. මා ද වසර කිහිපයක් පක්ෂයේ ලේකම්වරයා ලෙස කටයුතු කරන ලදී. එහිදී මා පක්ෂයේ සභාපතිතුමන් වශයෙන් ඔබතුමාගේ උපදෙස් පරිදි කටයුතු කළ බවටත්, කිසිදු අවස්ථාවක ඔබතුමා හෝ ඔබතුමාගේ මතය අභිබවා නොගිය බවටත් ඔබතුමා සාක්ෂි දරනු ඇත. එමෙන්ම පක්ෂය පිහිටුවන අවස්ථාවේ මූලික කරගත් සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු යන පංච මහා බලවේගය පෙරදැරිව කටයුතු කරන ලදී. ඒ අනුව මා දන්නා පරිදි අපේ පක්ෂයේ ලේකම්වරයෙකු පක්ෂ සංවිධායකවරයෙකුට, පාක්ෂිකයෙකුට හෝ හිතවතෙකුට අබමල් රේණුවක තරම්වත් හිංසාවක් හෝ පීඩාවක් කර නොමැත.**

එලෙසම පොදුජන පෙරමුණ තුළ ගොනු වී සිටින්නේ අපේ ආදරණීය නිදහස් පාක්ෂිකයන්ය. අප දීර්ඝ කාලයක් දේශපාලන වශයෙන් සාකච්ඡා කරනු ලැබුවේ ඔවුන්ව දිනා ගනු ලබන හා ආකර්ෂණය කරගනු ලබන ආකාරයයි. ඒ අනුව "අපේ මහගෙදර" යන පාඨය පක්ෂය විසින් සමාජ ගත කරන ලදී. එයට විශාල ආකර්ෂණයක් අදත් පවතී. නමුත් මෙම මැතිවරණයේදී දෙහිවල-ගල්කිස්ස මහ නගර සභාව සඳහා හිටපු පළාත් සභා මන්ත්‍රීවරයෙකු වූ පොදුජන පෙරමුණේ හිටපු අමල් මන්ත්‍රීවරයා ඇතුලු විශාල පිරිසක් පක්ෂයට පැමිණ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් නාම යෝජනා ලබා දෙන ලදී. නමුත් අපට ඔවුන්ව රැකගැනීමට නොහැකි විය. එයට පූර්ණ ලෙස බලපාන ලද්දේ පක්ෂ ලේකම්වරයාගේ ක්‍රියාකලාපයයි. ලේකම්වරයා ඔවුන්ද අත ලකුණින් තරහ කිරීම නිසා දිගින් දිගටම පල නොකියා පලා බෙදමින් කටයුතු කිරීම හේතුවෙන් ඔවුන් නැවතත් මැයි පළමු වෙනිදා පොදුජන පෙරමුණේ වේදිකාවට ගොඩවෙන ලදී.

ගරු සභාපතිතුමනි, මේ පක්ෂයට එකතු වන ඕනෑම තරාතිරමක ඕනෑම අයෙක් අපට ඉතා වටින්නේය.ඔවුන් සියලු දෙනා මේ රටේ පුරවැසියන්ය,ඡන්ද දායකයින්ය. අපි පක්ෂය ගොඩනගනවා යනු මෙකී සියලු බලවේග වල ශක්තිය එකතු කිරීම හැර වෙන කුමක්ද? මෙය තේරුම් නොගන්නා කිසිවෙකුට හෝ යළි අපේ ආදරණීය පක්ෂය ශක්තිමත්ව ගොඩ නැගීමේ හැකියාවක් ලැබෙන්නේ නැත.

ගරු සභාපතිතුමනි, පසුගිය දිනවල පක්ෂ ලේකම්වරයාගේ හඬපටයක් විද්‍යුත් හා සමාජ මාධ්‍ය ඔස්සේ විකාශනය විය. එයින් පක්ෂ ලේකම්වරයා මාව සෘජුව දෝෂදර්ශණයට ලක්කරනු ලැබුවේය. ඔහු මට එරෙහි වීම අරුමයක් නොවනු ඇත. මා මෙම ලිපියෙන් ඉදිරිපත් කරන දේශපාලන කරුණු පක්ෂය ගොඩනැගීම හා පක්ෂයේ ඉදිරි ගමනට අදාල වන අතරම, ලේකම්වරයා විසින් සිදුකරන පක්ෂයට නොගැලපෙන ක්‍රියාමාර්ග විවේචනය කිරීම මෙයට හේතු වී ඇත.මා එලෙස කරනු ලැබුයේ අපගේ ආදරණීය පක්ෂය රැක

ගැනීමටය. අද මෙම ලිපිය ලියන්නේ පක්ෂය කෙරෙහි අපට තිබෙන සැබෑ කැක්කුම සහ ආදරය නිසාය. පක්ෂයට හානියක් සිදු වීම උපන්ගෙයි ශ්‍රී ලංකා කාරයන් වන අපට කිසිසේත් ඉවසිය නොහැකිය. එම හඬපටයෙන් පක්ෂයේ ලේකම්වරයා ශ්‍රී.ල.නි.ප. ගම්පොළ ආසනයේ සම සංවිධායක නුගවෙල මහතා අමතමින් පරුෂ වචනයෙන් බැන වැදීම කිසිසේත් අපට අනුමත කළ නොහැක. මෙලෙස පක්ෂයේ ආසන සංවිධායකවරයෙකුට නොගැලපෙන වචන වලින් බැන වදිමින්, බිය ගන්වමින්, තර්ජනය කරමින් පක්ෂය ගොඩ නැංවීමේ හැකියාවක් තිබේද? මෙවා අහන විට දකින විට පක්ෂයට අලුත් බලවේග, නව පරපුරේ දූවා දරුවන්, උගතුන්, බුද්ධිමතුන්, වියතුන් තනතුරු හා වගකීම් භාර ගෙන එකතු වේවිද? ලේකම්වරයාගේ මෙම පරුෂ භාෂාවට සහ අත්තනෝමතික ක්‍රියා කලාපයට ගැලපෙන පිරිස් අප වටා එකතු වුවහොත් මෙම පක්ෂයේ අනාගතය සහ රටේ අනාගතයට කුමක් වේවිද?

එලෙසම අප දන්නා තරමින් 2022 වසරේ මැයි 09 වන දා වන විට රටම ගිනිගෙන දැවී ගියේය. ඒ මේ සමාජය වෙලාගත් දැවැන්ත අරගලය හේතුවෙනි. එය හරියටම සිදුවී මේ මැයි 09 වන විට වසරක් පිරෙනු ඇත. එයට සම්බන්ධ වූයේ රටේ තරුණ ප්‍රජාවයි. ඔවුන් ඉල්ලා සිටියේ "සිස්ටම් චේන්ජ්" එකකි. ඒ අනුව, බලන කල ශ්‍රී.ල.නි.ප ලේකම්වරයා රටට නව ආදර්ශයක් සපයමින් නුගවෙල  සංවිධායකවරයාට කුණුහරුපෙන් බනින හඬපටය විකාශනය වන විට එදා අරගලයේ දී සමාජ වෙනසක් ඉල්ලා සිටි දරුවන් ශ්‍රී.ල.නි.ප.ය හඳුනා ගන්නේ ලේකම්වරයාගේ මෙකී හැසිරීම,  ක්‍රියාකලාපය හා භාවිතාව අනුව නොවේද?  ශ්‍රීලනිපය යනු ලේකම්වරයා සිතාගෙන සිටින ආකාරයේ ඔහුගේ වහල් කඳවුරක් නොවන බව ඔහු වටහා ගත යුතුය.මෙවැනි විකාර රංගන නවීන සමාජයට හෝ නවීන සමාජයේ ආකල්ප වලට ගැලපෙන්නේ නැත.මෙවැනි දේශපාලනයක් 70 සහ 80 දශක වලට එහා කාල වකවානුවලදී ලංකාවේ තිබී ඇත. වර්තමානයට මෙවැනි විකාර රංගන කිසිසේත් අදාල වන්නේ නැත.  වර්තමාන ලෝකයත් අපේ සමාජයත් විශාල වෙනසකට භාජනය වී ඇත. ශ්‍රී.ල.නි.ප.ය එය හඳුනාගත යුතුය. නවීන සමාජය ඉල්ලා සිටින වෙනසට ගැලපෙන නායකයින් ශ්‍රීලනිපය විසින් බිහි කිරීම පක්ෂයේ උන්නතිය හා ඉදිරිගමන වෙනුවෙන් කරනු ලබන ඉතා වැදගත් මෙන්ම කාලෝචිත ක්‍රියාවක් බව මාගේ විශ්වාසයයි.

ගරු සභාපතිතුමනි, මෙම ලිපියෙහි සඳහන් ඉහත කරුණු සියල්ලම මා විසින් ඉදිරිපත් කරණු ලැබුයේ ඔබතුමාටත් ශ්‍රීලනිපයටත් මාගේ සහ අපේ පවුලේ ඇති ආදරය ගෞරවය නිසාවෙනි. මාගේ පියා වන දිවංගත බර්ටි ප්‍රේමලාල් දිසානායක මැතිතුමා ශ්‍රී.ල.නි.ප.ය සහ පාක්ෂිකයන් වෙනුවෙන් කරන ලද කැපකිරීම අසීමිතය. එය ඔබ තුමා ඉතා හොඳින් දන්නා කරුණකි. එලෙසම එතුමාගේ අභාවයෙන් පසු පක්ෂයේ අනුරාධපුර  දිස්ත්‍රික්කයේ සියලුම වගකීම් අදටත් මතුවටත් මා උසුලන අතර, 2015 ඔබතුමාගේ ජයග්‍රහණය වෙනුවෙන් නොබියව ඔබතුමා සමඟ නැගී සිටියෙමි. මා හට ඒ හැකියාව සහ ශක්තිය උරුම වූයේ මාගේ පියාගෙන් ඉගෙන ගත් දේශපාලන ප්‍රතිපත්ති සහ ගතිපැවතුම් හා භාවිතාව තුලිනි.

මාගේ පියා සහ ඔබතුමා සමකාලීන මිතුරන් සේම ශ්‍රී.ල.නි.ප.යේ දේශපාලන නායකයන් වන හෙයින් මා පියාගේ අඩිපාරේ යමින් දේශපාලනය ඉගෙන ගත්තා සේම ඔබතුමාගෙන් ද ශ්‍රී.ල.නි.ප.යටත් මා හටත් තව බොහෝ දේශපාලන කරුණු කාරණා සහ අත්දැකීම් ඉගෙන

ගැනීමට අවකාශ සහ අවස්ථා ඇත. පක්ෂයක දේශපාලන ගමන හා දේශපාලන නායකත්වය යනු ආභාෂය, කළ පුරුද්ද, පළපුරුද්ද, අත්දැකීම, අත්විඳීම, දැනුම, අධ්‍යාපනය මෙන්ම ඉවසීම, අන් අයට ගරු කිරීම සහ ඇහුම්කන් දීම යන ගුණයන්ගෙන් සමන්විත වන මානව සම්පත් කළමනාකරණය සහිත විෂයයක් බව අපගේ සියලුම නායකයන් සහ සංවිධායකවරු තේරුම් ගැනීම ඉතා වැදගත් කරුණකි.

වර්තමානයේ පවතින දේශපාලන අභියෝගවලට අනුව නව පරපුර ඉල්ලා සිටින දේශපාලන වෙනස්කම්වලට ගැළපෙන පරිදි අප පක්ෂය ගොඩනැගිය යුතුය. අපට ගමේ ශාඛා සමිතියේ සිටින පක්ෂ සාමාජිකයාගේ සිට පක්ෂ නායකත්වය දක්වා දිවෙන පක්ෂයේ සෑම ස්ථරයක්ම ඉතා වැදගත් වනු ඇත. පක්ෂ ජයග්‍රහණයේ මහා දැවැන්ත ශක්තියේ උල්පත වන්නේ මෙකී ජව සම්පන්න පාක්ෂික බලවේගයයි. අපගේ සෑම කාර්යයකදීම කාලය, ධනය, ශ්‍රමය වැය කර තම පෞද්ගලික කාර්යයන් පසෙකලා පක්ෂය වෙනුවෙන් කැපකිරීම් කරන්නේ මෙකී බලවේගයයි. බිම් මට්ටමේ ශාඛා සමිති, ආසන බලමණ්ඩල, ආසන අනුබද්ධ සංවිධාන පිහිටුවමින් පක්ෂය බලගැන්වීමත්, පක්ෂ සංවත්සර, ජාතික සම්මේලන, මැයි දින රැළි, පළාත් පාලන/පළාත් සභා/පාර්ලිමේන්තු/ජනාධිපතිවරණය යන මැතිවරණයන්වලදී සංවිධායකවරු සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරනු ලබයි. ඒ හේතුවෙන් ඔවුන් වෙත අභිමානයක් හා ගෞරවයක් නිරන්තරයෙන් ලබා දිය යුතුය. අප එය අගය කරමින් ආරක්ෂා කළ යුතුය, දිරිගැන්විය යුතුය. ඇතැම්විට පක්ෂයෙන් ඔවුන්ට ලැබෙනුයේ හුදෙක්ම ආත්මතෘප්තියක් පමණි. ලේකම්වරයාගේ ඉහත හඬපටය තුළ මෙවැනි සංවිධායකවරුන් අධෛර්යමත් වනු ඇත. සංවිධායකවරුන්ට බැනවැදීම, තර්ජනය කිරීම සහ ඔවුන් අපහසුතාවයට පත් කිරීම වර්තමාන ලේකම්වරයාගේ කාලය තුළ මෙයට පෙරද සිදුවී ඇති බව ඔබතුමා වෙත දැනුවත් කරන්නේ ඉතා කණගාටුවෙනි.

ශ්‍රී.ල.නි.ප.යට විශාල බලවේගයක් ගොඩනැගීමේ හැකියාවක් සහ අවකාශයක් ඇත. වර්තමාන දේශපාලනය එයට ගැළපෙන පරිදි අප නිවැරදිව හඳුනා ගත යුතුය. වර්තමාන සමාජය විශාල වෙනසකට භාජනය වී ඇත. රටේ අරගල කරන නව පරපුරක අවශ්‍යතා අප එලෙසම හඳුනා ගත යුතුය. පක්ෂයේ තනතුරු ආභරණයක් ලෙස තබා ගැනීමෙන් පක්ෂයටත්, එවැනි පුද්ගලයන්ටත් සිදුවන සෙතක් නැත. එය වර්තමාන සමාජයට කිසිසේත් ගැළපෙන්නේ හෝ වැදගත් වන්නේ නැත. වර්තමාන ශ්‍රී ලාංකීය තරුණයා යනු පූර්ණ බලතල සහිත විධායක ජනාධිපතිවරයෙක් සහ තුනෙන් දෙකේ බලයක් සහිත උද්ධච්ඡ නායකයන් සිටි ආණ්ඩුවක් ගහල පන්නල මහ මුහුදෙන් ද එහාට පන්නා දමා එයින් පන්නරය ලැබූ පරපුරක් බව අප අමතක නොකළ යුතුය. මෙකී තරුණයා අදත් හෙටත් මතු අනාගතයේදීත් ශ්‍රී.ල.නි.ප සාමාජිකයන්, සංවිධායකවරු සහ නායකයන් ද වන බව අප තේරුම් ගෙන කටයුතු කිරීම බුද්ධිගෝචර වනු ඇත.

ගරු සභාපතිතුමනි, මා මේ ඉහත දක්වන ලද දේශපාලන ගැටලු සහ සංවිධායකයන් මුහුණ දෙන දුෂ්කරතා, අපහසුතා මෙන්ම ඔවුන්ගේ අසරණකම, ඔවුන් බියගන්වමින් පක්ෂය එපා කරවන වැඩපිළිවෙල, පක්ෂ යාන්ත්‍රණය තුළ හිමි ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය ශක්තිමත් කිරීමට සහ පක්ෂ සාමාජිකයන්ට මෙන්ම පක්ෂ සංවිධායකවරුන්ට දේශපාලනය කිරීමේ නිදහසට විශාල හානියකි. ලේකම්වරයාගේ මෙවැනි ක්‍රියා තුළින් පක්ෂයේ ගමන දුර්වල වේ. පක්ෂයේ ඉදිරි ගමනට බාධා ඇති කරමින් ගමන් මග අහුරනු ලබන මෙකී කරුණු

සම්බන්ධයෙන් පක්ෂය තුළ ඉතා වැදගත් මෙන්ම පුළුල් දේශපාලන කතිකාවක් ආරම්භ කිරීම කාලෝචිත වනු ඇත. ඒ අනුව පක්ෂයේ උන්නතිය හා ඉදිරි ගමන වෙනුවෙන් සුදුසු පියවර සහ ක්‍රියාමාර්ග වහවහා ගැනීම ඉතා වැදගත් බව සිහිපත් කරමු.

එලෙස විවිධ ප්‍රතිවිරෝධ හේතුවෙන් අනවබෝධයෙන් (ඇතැම් විට විවිධ අය පක්ෂය භේද බින්න කිරීමට අටවන ලද උගුල හේතුවෙන්) පක්ෂයෙන් ඈත්ව සිටින සංවිධායකයන්, පාක්ෂිකයන් මෙන්ම ක්‍රියාකාරීන් නැවත එකතු කර ගැනීම ඔබතුමාට මහත් ශක්තියක් සහ ජවයක් වනු ඇත. එයින් පක්ෂයට නව ජවයක් සහ ජීවයක් ලැබෙනු ඇත. විවිධ හේතූන් මත පක්ෂයෙන් ඉවත් වූ විශාල පිරිසක් නිහඬව බලා සිටී. එකී සියලු දෙනා ඔබතුමාගේ නායකත්වය විශ්වාස කරන අතර ඔබතුමා මානුෂීය හා ප්‍රජාතන්ත්‍රවාදී නායකයෙකු ලෙස එම සියලු දෙනාගේම ඉමහත් විශ්වාසයක් අදටත් ඇත. ඒ අනුව ඔබතුමා පක්ෂයේ උන්නතිය වෙනුවෙන් විවිධ හේතූන් මත විවිධ අය විසින් දොරගුළු ලා අහුරා ඇති පක්ෂයේ ගමන් මගට අදාල මාවත් සියල්ල නැවත විවෘත කරමින් මෙකී මහා බලවේගයේ ශක්තිය පක්ෂයට එකතු කර ගනිමින් පක්ෂය විශාල පිම්මකින් පෙරට යනු ඇති බව මාගේ විශ්වාසයයි. මෙකී මහා බලවේගයේ ශක්තිය ඔබතුමාගේ නායකත්වයෙන් නැවත පක්ෂයට එකතුකර ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන්ටත් අපේ රටේ ආදරණීය ජනතාවටත් ශක්තිමත්ව නැඟී සිටිය හැකි යුගයක් නැවත ඇරඹීමට පියවර ගන්නා ලෙස ඔබතුමා මෙන්ම කිසිදා පක්ෂය වෙනස් නොකල අයෙකු ලෙස මා ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

උතුම් ජය ශ්‍රී මහ බෝ සමිදු පිහිටයි!

මෙයට-විශ්වාසී වූ

**දුමින්ද දිසානායක (පා.ම.)**
ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජාතික සංවිධායක

පිටපත්:

01.දේශපාලන මණ්ඩල සාමාජිකයින් වෙත
02.මධ්‍යම කාරක සභා සාමාජිකයින් වෙත
03.දිස්ත්‍රික් නායකවරුන් වෙත
04.ආසන සංවිධායකවරුන් වෙත
05.දිස්ත්‍රික් සංවිධායකවරුන් වෙත
06. කාර්ය මණ්ඩල ප්‍රධානී - ශ්‍රී.ල.නි.ප
} අ.ක.ස